# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සිවිල් ගුවන් සේවා (සංශෝධන)

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා විසින් 2023 සැප්තැම්බර් මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 අගෝස්තු මස 16 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[200 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය:*** මේ වගන්තිය මඟින් 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඉ) වන ඡේදය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ එකී ඡේදයේ සඳහන් ගගන නාවික සේවා සැපයීම සඳහා එක් සේවා සැපයුම්කරුවකුට වඩා වැඩි සංඛ්‍යාවක් පත් කිරීම සහ සේවා සැපයුම්කරුවකු වශයෙන් රාජ්‍ය සංස්ථාවක් හෝ ආණ්ඩුව විසින් බහුතර කොටස් සංඛ්‍යාවක් දරනු ලබන සමාගමක් ඒ සේවා සැපයුම්කරු ලෙස පත් කිරීමට අදාළ ව වූ සීමාව ඉවත් කිරීම වේ.

## සිවිල් ගුවන් සේවා (සංශෝධන)

එල්.ඩී.-ඕ. 29/2023

### 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

**1.** මේ පනත 2023 අංක         දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2010 අංක 14 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම*

**2.** 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියේ (ඉ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

> "(ඉ) 31 වන වගන්තියේ (එ), (ඒ), (ඔ), (ඕ) හෝ (ක) ඡේදයේ නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා, එකී වගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව සඳහන් යම් ගගන යාත්‍රාංගනයක දී සැපයීම සඳහා සේවා සපයන්නන් ලෙස එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය:
>
> එසේ වුව ද, 31 වන වගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් ගගන යාත්‍රාංගනයක දී මේ ඡේදයේ සඳහන් ගගන නාවික සේවා සැපයීමට මේ ඡේදය යටතේ පත් කරනු ලබන සේවා සැපයුම්කරුවකු කැමති නොවන්නේ නම්, අමාත්‍යවරයා විසින්, මේ ඡේදයේ සඳහන් ගගන නාවික සේවා සැපයීමට වෙනත් යම් සේවා සැපයුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.".

*අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව*

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.